www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරාන ශිෂ්‍යයන් නිදහස් කරගැනීමේ සසජාශි උද්ඝෝෂනයේදී වැඩකරන ජනතාවගේ ජාත්‍යන්තර එකමුතුවකට ආයාචනා

## ISSE demonstration to free Iranian students calls for international unity of workers

**අපේ වාර්තාකරු විසිනි**
**2008 පෙබරවාරි 19**

සිර ගත කොට ඇති හතලිහකට වැඩි වාමාංශික සිසුන්ට එරෙහි සියලු චෝදනාවලින් ඔවුන් නිදොස් කොට වහාම නිදහස් කරන ලෙස ඉරාන රජයෙන් ඉල්ලා , සමාජ සමානතාවය සඳහා වූ ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) පෙබරවාරි 16 දා නිව්යෝක්හි දී විරෝධතාවයක් පැවැත්වූහ. රැස්වීමේ එල්ලය වූයේ මෙම සිසුන්ගේ තත්වය සම්බන්ධව අවධානය දිනා ගැනීමට අමතරව යුද්ධයට, අසමානතාවට සහ පරිපීඩනයට එරෙහිව අරගලයක් සඳහා අවශ්‍ය දේශපාලන පදනම ගැන ද සාකච්ඡා කිරීමයි.

සසජාශි සාමාජිකයෝ සහ ආධාරකරුවෝ එක්සත් ජනපද විශ්ව විද්‍යාලවල අධ්‍යාපනය ලබන ඉරාන සිසුන් කන්ඩායමක් ද සමග එක්ව මැන්හැටන් මධ්‍ය නගරයේ එක්සත් ජාතීන්ගේ ඉස්ලාමීය ඉරාන සමූහාන්ඩුවේ කාර්යාලය ඉදිරිපිට රැස්වූහ. ශිෂ්‍යයන්ගේ සහ කම්කරුවන්ගේ ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක අවශ්‍යතාවය විරෝධතාකරුවෝ අවධාරනය කලහ. ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ඉතිහාසය සහ ඉදිරි දර්ශනය මත පිහිටමින් ඉරාන රජය ද ඇතුලත් ජාතිකවාදී ධනේශ්වර ආන්ඩුවලට කිසිදු සහයෝගයක්දීම සසජාශි ප්‍රතික්ෂේප කලේ ය. සසජාශි යනු හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (හජාජාක) ශිෂ්‍ය සංවිධානය යි.

අසාඩි බරබාරි (නිදහස හා සමානතාවය සඳහා වූ ශිෂ්‍යයෝ) කන්ඩායමේ සාමාජිකයින් අත්අඩංගුවට ගැනීමට විරෝධය පලකරමින් ඉරාන රජයට ලියන ලද ලිපිය සසජාශි සාමාජිකයෙක් වන ජෝ කේ කියවීය.

එක්සත් ජනපද යුධ සැලසුම් වලට ප්‍රසිද්ධියේ චෝදනා කරන්නට මෙම කන්ඩායම විරෝධතාවයක් සංවිධානය කරද්දී ගිය දෙසැම්බරයේදී පලමු අත් අඩංගු රැල්ල ක්‍රියාත්මක විය. හිටපු ජනාධිපති මොහමඩ් කටාමි වටා රොක්වුනු ප්‍රතිසංස්කරනවාදීන් ද ඇතුලත් ඉරාන ආන්ඩුවේ සියලු කල්ලිවලට තම විරුද්ධත්වය සිසුහු ප්‍රකාශ කලහ. මෙම විරෝධතාවයට එක්වූ සිසුන් තීරනාත්මක අන්තර්දෘෂ්ඨියකට ලගාවෙමින් තිබුනු බව කේ පැවසීය. "යුද්ධයට සහ අධිරාජ්‍යවාදයට එරෙහි ව්‍යාපාරයක් ජාතිකවාදී ධනේශ්වරයට හෝ ජාතිකවාදී ඉරාන හෝ වෙනත් කිසිඳු රටක ආන්ඩුවලට යටත්ව තබන්නට නොහැකි ය" යි ඔහු පැවසීය.

සසජාශි ඇමරිකන් පාලක ප්‍රභූවට ත් මැද පෙරදිග ඔවුන්ගේ අභිලාෂයන්ට ත් සම්පූර්නයෙන්ම විරුද්ධ බව කේ අවධාරනය කලේය. "ඉරානයට එරෙහි කිසිඳු ක්‍රියාවකට විරුද්ධ අපි 'ආන්ඩු වෙනස් කිරීමේ' සැලසුම් වලට ද විරුද්ධ වෙමු. ඇමරිකන් අධිරාජ්‍යවාදී සැලසුම් වලට අපි සහයෝගය නොදෙමු," යයි ඔහු පැවසීය. " කෙසේවුවද ඇමරිකන් අධිරාජ්‍යවාදයට අපේ විරුද්ධත්වය, ප්‍රතිගාමී හා ප්‍රජාතන්ත්‍රවිරෝධී ඉරාන හෝ කිසිඳු වෙනත් රටක ධනේශ්වර ආන්ඩු සඳහා කිසිඳු සහයෝගයක් ඇඟවුම් නො කරයි. යුද්ධයට එරෙහි අරගලය සඳහා මෙම සියලුම රාජ්‍යයන්ට විරුද්ධව ත් ජාතික-රාජ්‍ය පද්ධතියට විරුද්ධව ත් කම්කරුවන් සහ සිසුන් ස්වාධීනව බලමුලුගැන්වීම අවශ්‍යව පවතී."

2007 මාර්තු 31 - අප්‍රේල් 1 පැවති යුද්ධයට එරෙහි සසජාශි/සසප හදිසි සමුලුවෙහිදී සම්මත කෙරුනු ප්‍රකාශනයෙන් කොටස් කේ කියවීය. ඇමරිකන් අධිරාජ්‍යවාදයේ විදාරනය සමස්ත ලෝක ප්‍රජාව ම අන්තරායට පමුනුවන බව සටහන් කල ප්‍රකාශනය ඉරාක යුද්ධය සහ ඉරානයට එරෙහි හමුදා ක්‍රියාමාර්ග සඳහා සැලසුම්වලට ප්‍රසිද්ධියේ විරෝධය පල කලේය. "ප්‍රජාතාන්ත්‍රික සහ සමානාත්මතා ලෝක සමාජවාදී සමාජයක් ස්ථාපිත කිරීම පෙරදැරි කරගත් ජාත්‍යාන්තර කම්කරු පන්තික එක්සත් භූගෝලීය අරගලයකින් පමනක් නව ලෝක යුද්ධයක තර්ජනයකට පිලිතුරු සැපයිය හැකිය"යි එය ප්‍රකාශ කලේය.

කම්කරු පංතිය ස්වාධීනව බලමුලුගැන්වීම සඳහා ඉදිරි දර්ශනය සකස් කිරීමේදී ප්‍රකාශනය ජාතිකවාදී ඉදිරි දර්ශන සුපැහැදිලිව ම ප්‍රතික්ෂේප කර ඇත. " ඉරානය, චීනය සහ ඉන්දියාව වැනි ආර්ථික වශයෙන් ඌන සංවර්ධිත රටවල පාලක ප්‍රභූවේ අභිරුචියන් සහ අභිලාෂයන් කම්කරු පංතියේ අභිලාෂයන්ට සම්පූර්නයෙන් ම ප්‍රතිවිරුද්ධවන අතර අධිරාජ්‍යවාදයට

කවර ආකාරයේ හෝ ප්‍රතිපත්තිමය විරුද්ධත්වයක් නො පවතී. මෙම රටවලට එරෙහිව ක්‍රියාත්මක වන යුද්ධවලට විරුද්ධවීම, එම ආන්ඩුවලට හෝ එම ආන්ඩු නියෝජනය කරන ධනවාදී ප්‍රතිපත්තිවලට සහයෝගය දීමක් කිසිදු ආකාරයකින් නො අඟවයි. ජාත්‍යන්තර කම්කරු පංතිය සමාජවාදී වැඩපිලිවෙලක් මත ස්වාධීනව බලමුලුගැන්වීමකින් විනා, එම රටවල් මගින් කෙරෙන න්‍යෂ්ඨික හෝ අනෙකුත් ආයුධ අත්පත් කරගැනීමකින් අධිරාජ්‍යවාදය පරාජය කල නො හැකිය."

"තරගවදින ජාතික රාජ්‍යවල ධනවාදී ක්‍රමයේ සීමාවල් ඉක්මවා යන සමාජ අවශ්‍යතා ඇති" කම්කරු පංතිය "එකම අව්‍යාජ ජාත්‍යන්තර පංතිය" බව ප්‍රකාශනය අවධාරනය කර ඇත. (බලන්න "ඉරාකයේ වාඩිලාගැනීම නවතනු! ඉරානයට එරෙහි යුද්ධයට විරුද්ධ වනු! යුද්ධයට එරෙහි ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක් සඳහා!")

ඉරාන සිසුන් අත් අඩංගුවට ගැනීමෙන් මෙම ඉදිරි දර්ශනය සනාථ වී ඇති බැව් කේ පැවසීය. එය පෙන්නුම් කලේ ඉරාන ආන්ඩුව තම දක්ෂිනාංශික ප්‍රතිපත්තිවලට එරෙහි විරෝධතාවන්ට මුහුන පෑ විට එයට ප්‍රතිචාර දැක්විය හැක්කේ මර්ධනය මගින් පමනක් බව යි. යුද්ධයට එරෙහිව ත් පන්ති විරහිත සමාජවාදී සමාජයක් සඳහා ත් පොදු අරගලයක් තුල සමස්ත ලෝකයේ කම්කරුවන් හා ශිෂ්‍යයන් සමග අත්වැල් බැඳ ගන්නා ලෙස ඉරාන සිසුන්ට ආයාචනා කරමින් ඔහු තම කතාව සමාප්ත කලේ ය.

සහභාගි වූවන්ගෙන් සමහරු ජාත්‍යාන්තරවාදයේ භූමිකාව අවධාරනය කලහ. "එක්සත් ජනපදයේ සිසුන් සහ කම්කරුවන් මුහුන දෙන ප්‍රශ්න ත්, ඉරාන සිසුන් සහ කම්කරුවන් හා ලෝකය පුරා කම්කරුවන් මුහුන දෙන ප්‍රශ්න ත් එක සමානයි." ඩෙලවෙයාර් විශ්ව විද්‍යාලයේ සිසුවෙක් සහ සසජාශි කමිටුවේ සාමාජිකයෙක් වන අන්ඩ්‍රේ ඩේමන් අදහස් පල කලේ ය.

කම්කරුවන් සහ සිසුන් මහා පරිමාන නය කන්දරාවක ගිලී සිටින බව ඩේමන් සඳහන් කලේය. " පසුගිය දශක ගනනාව පුරාවට එක්සත් ජනපදය තුල වැටුප් එකතැන පල්වී සහ පහලට වැටී ඇති අතරේදී ජීවන වියදම ඉහල ගොස් ඇත. ඉගැන්වීම් සඳහා ගෙවීමට හා වියදම් සහ නිවාස සඳහාත් සිසුන්හට වසරකට ඩොලර් 10, 20, 30, හෝ 50 දහස් ගනන් පමනින් සමහර අවස්ථා වලදී නයට ගැනීමට සිදුව ඇත. එක්සත් ජනපදය අවපාතයක් කරා ඇද වැටෙමින් පවතින බැවින් ආර්ථික තත්වය තවදුරටත් පහල යා හැකි බව" ඩේමන් පෙන්නා දුන්නේය.

යුද්ධයේ අන්තරායකට මුලු ලෝකය ම මුහුන දෙමින් සිටින බව ඩේමන් පැවසීය. "මෙම සියලු ප්‍රශ්න ජාතිකවාදී පදනම මත හෝ ශිෂ්‍ය පදනමක මතව ත් විසඳිය නො හැක. ශිෂ්‍යයින් කම්කරු පංතිය දෙසට, ජාත්‍යන්තර කම්කරු පංතිය දෙසට, හැරිය යුතු අතර සසජාශි ය එම ඉදිරි දර්ශනය සඳහා සටන් කරයි."

ඉරානයේ වාමවාදී සිසුන්ට ප්‍රහාර එල්ල කිරීම " ජාත්‍යාන්තර කාරනාවක්" වන බව ස්ටේටන් දූපතේ වැග්නර් පාසැලේ නවකයෙක් වන ජූලියා පැවසුවා ය. මෙම විරෝධතාවය "ඉරානයේ සිසුන් පමනක් නොව, එක්සත් ජනපදයේ සිසුන් පවා තමන්ට සහයෝගය පල කරන බව ඉරානයේ සිසුන්ට පෙන්නා දෙන බව තමන් විශ්වාස කරන බව" ඇය පැවසුවාය.

විරෝධතාවයට සහභාගී වූ බොහෝ දෙනෙක් ඉන් පසුව ඉරානයේ සහ එක්සත් ජනපදයේ කම්කරුවන් මුහුන දෙන දේශපාලන ප්‍රශ්න ගැන සාකච්ඡා කලහ.

2006දී, එක්සත් ජනපද සෙනෙට් සභාවට නිව්යෝක් නගරයෙන් තරග කල සමාජවාදී සමානතා පක්ෂයේ බිල් වෑන් ඕකන්, ලෝක ධනවාදයේ ආර්ථික අර්බුදයේ සන්දර්භය තුල ජාත්‍යන්තරව පැන නගින සමාජ ආතතීන්ගේ වැඩෙන සලකුනු දැක්වූවේ ය. ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක වැඩීම සඳහා පදනම් සැකසෙන්නේ ලෝක ධනවාදයේ වෛෂයික පරස්පරයන් මතින් බව ඔහු පැවසීය.

ඉරාන ඉතිහාසය සහ විසිවන ශතවර්ෂයේ කම්කරු පංතියේ අත්දැකීම් එල්ල කරගෙන සාකච්ඡාව සිදුවිය. මෙම කාලය පුරාවට ම, අද දින හජාජාක විසින් නියෝජනය කෙරෙන ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය, ජාතිකවාදයේ සහ ප්‍රතිසංස්කරනවාදයේ සියලුම හැඩතලයන්ට එරෙහිව ජාත්‍යන්තර දිශානතියක් සඳහා සටන් කර තිබේ.

සමාජවාදීයැයි තමන්වම හඳුන්වා ගන්නා බොහෝ කන්ඩායම් මගින් හියුගෝ චාවෙස් ව ප්‍රශංසා කෙරෙන අතරේදී, වෙනිසියුලාවේ චාවෙස්ට ත් සහ ලතින් ඇමරිකාවේ වෙනත් ධනේශ්වර ජාතිකවාදයන්ට ත් එරෙහි හජාජාකයේ ස්ථාවර විරෝධය එක් සහභාගිකරුවෙක් පෙන්වා දුන්නේ ය. ඉරානයේදී සිසුන්ට සහ කම්කරුවන්ට දරුනු ප්‍රහාර ඉරාන ආන්ඩුව විසින් මුදා හරිද්දී පවා, චාවෙස් ඉරාන ජනාධිපති මහ්මූද් අහ්මඩිනෙජාඩ් සමග සමීප සම්බන්ධතා වගා දිගා කරගෙන ඇත.

© www.wsws.org